# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 51 දරන
# කම්කරුවන්ගේ රක්ෂාව අවසාන කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 07 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 දෙසැම්බර් මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 60 යි.     තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1988 අංක 51 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසාන කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 07 වන දින]

එල්. ඩී.—ඕ 2/85.

**1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසාන කිරීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1988 අංක 51 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසාන කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසාන කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1971 අංක 45 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(5) විනයානුකූල ක්‍රියාවක් ලෙස පනවන ලද දඬුවමක හේතුවෙන් යම් කම්කරුවකුගේ උපලේඛනගත රක්ෂාව යම් සේවා යෝජකයකු විසින් අවසන් කරනු ලබන අවස්ථාවක දී එම රක්ෂාව අවසන් කිරීමේ දිනයට පසුව එළඹෙන දෙවන වැඩ කරන දිනය අවසන් වීමට පෙර රක්ෂාව අවසන් කිරීම සඳහා වූ හේතු සේවා යෝජකයා විසින් එම කම්කරුවාට ලිඛිතව දැන්විය යුතු ය.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ආ) (i) සේවා යෝජකයා විසින් අනුමත කරනු ලැබූ යම් හේතුවක් මත සේවයට නොපැමිණි සෑම දිනයක් ම ද ;

(ii) සිය රක්ෂාව නිසා සහ රක්ෂාවේ යෙදී සිටිය දී ඇති වුන යම් හදිසි අනතුරකින් කම්කරුවාට ඇති වූ යම් තුවාල සිදුවීමක් නිසා සේවයට නොපැමිණි සෑම දිනයක් ම ද ;

(iii) ඇන්ත්‍රැක්ස් රෝගය හෝ (139 වන අධිකාරය වූ) කම්කරු වන්දි ආඥාපනතේ III වන උපලේඛනයෙහි දැක්වෙන යම් වෘත්තීය රෝගයක් නිසා හෝ සේවයට නොපැමිණි සෑම දිනයක් ම ද ;

(iv) කම්කරුවා රක්ෂාවෙහි නියුක්ත කරවීමට සේවා යෝජකයා අපොහොසත් වන සෑම දිනයක් ම ද ;

(v) පිටත ලෑමක් නිසා, හෝ දින සංඛ්‍යාවෙහි එකතුව දින තිහකට නොවැඩි වන්නා වූ ද අනීතික නොවන්නා වූ ද වැඩ වර්ජනයක් නිසා, සේවයට නොපැමිණි සෑම දිනයක් ම ද ;

(vi) යම් ලිඛිත නීතියක විධිවිධාන මගින් හෝ එය යටතේ හෝ කම්කරුවාට හිමිකම් ඇති සෑම නිවාඩු දිනයක් ම හෝ සේවයට නොපැමිණි සෑම දිනයක් ම ද ඇතුළත්ව,

සේවා නියුක්තියේ දිනයෙන් ආරම්භ වන මාස දොළහක අඛණ්ඩ කාලයක් ඇතුළත, දින එකසිය අසූවකට අඩු කාලයක් සඳහා සේවා යෝජකයකු විසින් සේවයෙහි නියුක්ත කර ඇති යම් කම්කරුවකුගේ රක්ෂාව අවසාන කිරීම සම්බන්ධයෙන් ; හෝ ".

ප්‍රධාන ප්‍රඥප්තියට 6ආ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

4. 6අ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 6ආ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතුය :—

" මාස හයකට පසු අයදුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමේ දී කිසිම නියෝගයක් නොකළ යුතු බව සහ වෙනත් නීත්‍යානුකූල සහන ලබා ගැනීම සඳහා කම්කරුවකුට ඇති අයිතිවාසිකම්.

6ආ. (1) රක්ෂාව අවසන් කිරීමෙන් මාස හයක් ඇතුළත එම අවසන් කිරීමට අදාළව අයදුම් පත්‍රය ඉදිරිපත් කරනු ලැබ ඇත්නම් මිස, කම්කරුවකු විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම් පත්‍රයක් සම්බන්ධයෙන් 6 වන වගන්තිය හෝ 6අ වන වගන්තිය හෝ යටතේ කොමසාරිස්වරයා විසින් කිසිම නියෝගයක් කරනු නොලැබිය යුතු ය.

(2) මේ පනතේ 2 වන වගන්තියට හෝ 5 වන වගන්තියට හෝ නැතහොත් රක්ෂාව අවසන් කරනු ලැබ ඇති කම්කරුවකු විසින් එම රක්ෂාව අවසන් කිරීම සම්බන්ධයෙන් වෙනත් යම් නීතිමය සහනයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමට ඇති අයිතිවාසිකම්වලට හෝ එම රක්ෂාව අවසන් කිරීම සම්බන්ධයෙන් සහන සැලසීම සඳහා යම් අධිකරණයකට, යම් විනිශ්චය අධිකාරයකට හෝ ආයතනයකට ඇති අධිකරණ බලයට හෝ හානිකර ලෙස මේ පනතේ ඇති කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියෙහි ඇති "6 වන වගන්තියෙහි විධිවිධාන" යන වචන වෙනුවට "6 වන වගන්තිය හෝ 6අ වන වගන්තිය යටතේ කරනු ලැබූ නියෝගයක්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියෙහි ඇති "6 වන වගන්තියෙහි විධිවිධාන" යන වචන වෙනුවට "6 වන වගන්තිය හෝ 6අ වන වගන්තිය යටතේ කරනු ලැබූ නියෝගයක්" යන වචන ආදේශ කිරීමෙන්.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ආ) (i) වරද, 6 වන වගන්තිය යටතේ දෙනු ලැබූ නියෝගයකට එකඟව ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් අදාළ වන වරදක් වන අවස්ථාවක දී එම නියෝගයේ නිශ්චිතව දැක්වෙන වැටුප් සහ ප්‍රතිලාභ ද එසේම 6 වන වගන්තිය යටතේ දෙනු ලැබූ නියෝගයක නිශ්චිතව දැක්වෙන දිනයකින් ආරම්භ වී එම සේවා යෝජකයා වරදකරු කරනු ලැබූ දිනයෙන් අවසන් වන කාල සීමාව සඳහා ඔහු රක්ෂාවේ නියුක්තව සිටියේ නම් ඔහුට ගෙවිය යුතුව තිබූ වැටුප් සහ ප්‍රතිලාභ ද ඔහුට ගෙවීම සඳහා ; හෝ

(ii) වරද, 6අ වන වගන්තිය යටතේ දෙනු ලැබූ නියෝගයකට එකඟව ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් අදාළ වන වරදක් වන අවස්ථාවක දී එම නියෝගයෙහි නිශ්චිත ව දැක්වෙන මුදල.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 177 යි. (විදේශීය) රු. 236 යි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.